# මහරගම තරුණ බෞද්ධ සංගමය

# Y.M.B.A. MAHARAGAMA

## සංවත්සර ප්‍රගති වාර්තාව

## 2019

2019 වර්ෂයේ ප්‍රගති වාර්තාව

2019 වර්ෂයේ ගිණුම් වාර්තාව

අංක 25, විද්‍යාකර මාවත, මහරගම

25, විද්‍යාකර මාවත
මහරගම
2020.02.06

## 2019 සංවත්සර මහා සභාවේ න්‍යාය පත්‍රය

01. පන්සිල් සමාදන්වීම.
02. සංගමයේ තේමා ගීතය වාදනය කිරීම.
03. ආරාධිතයින් හා සාමාජිකයින් පිළිගැනීමේ කථාව
04. දිවි පිදූ රණවිරුවන් හා අප අතරින් වියෝවූ සාමාජිකයින් සිහි කිරීම.
05. නොපැමිණෙන බව දන්වා එවා ඇති ලිපි ඉදිරිපත් කිරීම.
06. ඉකුත් සංවත්සර මහා සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීම.
07. 2019 ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම හා පිළිගැනීම.
08. 2019 ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම හා පිළිගැනීම.
09. ආරාධිත අමුත්තන් සභාව ඇමතීම හා තේ පැන් සංග්‍රහය
10. ඉකුත් වසරේ නිලධාරී මණ්ඩලය තනතුරු වලින් ඉවත්වීම.
11. තාවකාලික සභාපතිවරයෙකු හා නිලවරණ කමිටුවක් පත් කිරීම.
12. ඉදිරි වර්ෂයට නිලධාරින් පත් කර ගැනීම හා පුරප්පාඩු පිරවීම.

**2019 වසර සඳහා පහත සඳහන් නිල වලට සභිකයින් පත් කර ගත යුතුවේ.**

| | |
|---|---|
| i . ගරු සභාපති | (නිල 01 යි) |
| ii. ගරු ලේකම් | (නිල 01 යි) |
| iii. ගරු භාණ්ඩාගාරික | (නිල 01 යි) |
| iv. ගරු නියෝජ්‍ය සභාපති | (නිල 01 යි) |
| v. ගරු නියෝජ්‍ය ලේකම් | (නිල 01 යි) |
| vi. ගරු නියෝජ්‍ය භාණ්ඩාගාරික | (නිල 01 යි) |
| vii. ගරු උප සභාපති | (නිල 03 යි) |
| viii. ගරු උප ලේකම් | (නිල 03 යි) |
| ix. ගරු උප භාණ්ඩාගාරික | (නිල 03 යි) |
| x. ගරු කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජික | (නිල 08 යි) (පහත සටහන බලන්න) |

xi. ගරු අභ්‍යන්තර විගණක තනතුර සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම හා ස්ථිර කර ගැනීම
xii. අතුරු කාරක සභා සඳහා සාමාජිකයින් පත් කිරීම.
xiii. කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින් අතරින් ප්‍රචාරක නිලධාරියෙකු පත් කර ගැනීම.
xiv. කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින් අතරින් සහකාර අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකයින් දෙදෙනෙකු පත් කිරීම.
xv. පිළිකා රෝගීන්ගේ සුභ සාධන ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටුවට පත් කිරීම පිරිමි 4 ද කාන්තා 4 ද පරිපාලක හා සහාය පරිපාලක වරයෙකු ද පත් කර ගත යුතුය.

11. සංගමයේ දේපල පිළිබඳ භාරකාර මණ්ඩලයට සාමාජිකයින් දෙදෙනෙකු පත් කිරීම.
12. පිළිකා රෝගීන්ගේ සුභ සාධන භාරයේ භාරකාර මණ්ඩලයට සාමාජිකයින් දෙදෙනෙකු පත් කිරීම.
13. සංගමයේ කැට කමිටුව, මෙහෙයුම් කමිටුව, ඖෂධ කමිටුව, පුස්තකාල කමිටුව, සංස්කාරක මණ්ඩලය හා ප්‍රකාශන මණ්ඩලය පත් කිරීම.
14. සංගමයේ බල ප්‍රදේශය තුල ඒ ඒ ප්‍රදේශය සඳහා නියෝජිතයින් පත් කිරීම.
15. සංගමය වෙත ලැබී ඇති යෝජනා ඉදිරිපත් කිරීම හා සම්මත කිරීම.
16. මූලාසනයේ කථාව
17. ස්තුතිය (ඉහත (x) ආර්.බී.ගමගේ, එස්.ඒ.ඩී.එම්.පෙරේරා, ජයන්ත විජයවීර, යූ.සද්ධාසේනද සොයිසා, ජිම්සන් පියදාස, ජේ.ක්.ගමගේ, මල්ලිකා විජේසේකර හා ඉන්ද්‍රා කුමාරි මාරපන යන මහත්ම මහත්මීන්ගේ ධුර කාලය අවසන් වීමට නියමිතය.)

# සංවත්සර ප්‍රගති වාර්තාව - 2019

සංගමයේ 25 වන සංවත්සරය 2020 පෙබරවාරි මස 29 වන දින පවත්වනු ලබයි. 2019.02.23 දින පැවති සංවත්සර මහා සභාවෙන් පත් වූ කෘත්‍යාධිකාරී මණ්ඩලය පහත දැක්වේ. ඔවුන්ගේ නම් ඉදිරියෙන් ඔවුන් වර්ෂය තුල සහභාගි වූ කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව පහත දක්වා ඇත.

වර්ෂය තුල කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම් 11 ක් ද කාර්තු මහා සභා රැස්වීම් 03 ක් ද පවත්වන ලදි.

## 2019 නිලධාරී මණ්ඩලය

| අංකය | තනතුර | නම | සහභාගි වූ දින ගණන |
|---|---|---|---|
| 01 | ගරු සභාපති | එච්.එම්.තිලක් හේරත් මහතා | 08 |
| 02 | ගරු ලේකම් | ජ්.අයි.වී.පි.සමරසේකර මහතා | 10 |
| 03 | ගරු භාණ්ඩාගාරික | ගුණදාස අළුත්ගේ මහතා | 11 |
| 04 | ගරු නි/සභාපති | ඩී.පී.එල්.වෝල්ටර් සිල්වා මහතා | 06 |
| 05 | ගරු නි/ලේකම් | බී.පී.කරුණානන්ද මහතා | 08 |
| 06 | ගරු නි/භාණ්ඩාගාරික | ලක්ෂ්මන් ධර්මප්‍රිය මහතා | 08 |
| 07 | ගරු උප සභාපති | ආචාර්ය කේ.ආරියසිංහ මහතා | 05 |
| 08 | ගරු උප සභාපති | කේ.ඒ.පී.කළුආරච්චි මහතා | 09 |
| 09 | ගරු උප සභාපතිනි | සුනේත්‍රා සේනානායක මහත්මිය | 06 |
| 10 | ගරු උප ලේකම් | පී.ආර්.ලියනගේ මහතා | 10 |
| 11 | ගරු උප ලේකම් | පී.ඩී.ආර්.පෙරේරා මහතා | 09 |
| 12 | ගරු උප ලේකම් | සී.පලිහක්කාර මහත්මිය | 10 |
| 13 | ගරු උප භාණ්ඩාගාරික | අනුර සේනානායක මහතා | 09 |
| 14 | ගරු උප භාණ්ඩාගාරික | එස්.ඒ.ඥානරත්න මහතා | 07 |
| 15 | ගරු උප භාණ්ඩාගාරික | සුමිත්‍රා පෙරේරා මහත්මිය | 08 |
| 16 | ගරු ගිණුම් පරීක්ෂක | පී.ටී.සිරිසේන මහතා | 09 |
| 17 | ගරු සභික | එල්.බී.වත්තෙගෙදර මහතා | 01 |
| 18 | ගරු සභික | එස්.කේ.ගරුසිංහ මහතා | 08 |
| 19 | ගරු සභික | කේ.ඩබ්.ඒ.ජයවර්ධන මහතා | 10 |
| 20 | ගරු සභික | පී.බී.එච්.ලියනගේ මහතා | 07 |
| 21 | ගරු සභික | පී.රණසිංහ මහතා | 11 |
| 22 | ගරු සභික | තුඩුවගේ සිරිසේන මහතා | 09 |
| 23 | ගරු සභික | එම්.කේ.පී.ගැමුණු මහතා | 05 |
| 24 | ගරු සභික | සෝමනාත් වෙලබඩ මහතා | 09 |
| 25 | ගරු සභික | ඩී.එස්.ජයවර්ධන මහතා | 04 |
| 26 | ගරු සභික | එම්.එච්.කීර්තිපාල මහතා | 10 |
| 27 | ගරු සභික | උපාලි හැගොඩ මහතා | 10 |
| 28 | ගරු සභික | ඩබ්.ඒ.ප්‍රනාන්දු මහතා | 07 |
| 29 | ගරු සභික | රෝහිණී ෆොන්සේකා මහත්මිය | 03 |
| 30 | ගරු සභික | නිමල් කේ.පතිරණ මහතා | 09 |
| 31 | ගරු සභික | මයිකල් ගුරුගේ මහතා | 07 |

| | | | |
|---|---|---|---|
| 32 | ගරු සභික | වසන්ත ඒකනායක මහතා | 07 |
| 33 | ගරු සභික | ආර්.බී.ගමගේ මහතා | 04 |
| 34 | ගරු සභික | එස්.ඒ.ඩී.එම්.පෙරේරා මහත්මිය | 07 |
| 35 | ගරු සභික | ජයන්ත විජයවීර මහතා | 07 |
| 36 | ගරු සභික | යූ.සද්ධාසේන ද සොයිසා මහතා | 07 |
| 37 | ගරු සභික | පීමිසන් පියදාස මහතා | 04 |
| 38 | ගරු සභික | ජේ.කේ.ගමගේ මහතා | 09 |
| 39 | ගරු සභික | මල්ලිකා විජේසේකර මහත්මිය | 10 |
| 40 | ගරු සභික | ඉන්ද්‍රා කුමාරි මාරපන මහත්මිය | 06 |

# 2019 - වාර්ෂික වැඩසටහන

1. පිළිකා රෝගීන්ගේ ශුභ සාධන ව්‍යාපෘතිය
2. පිළිකා රෝගීන්ගේ ශුභ සාධන ව්‍යාපෘතිය හා බැඳුනු කැට ආධාර ව්‍යාපෘතිය
3. ඖෂධ සහන සැලසීම
4. සංගමයේ රීති මාලාව සංශෝධනය හා නැවත මුද්‍රණය
5. සංමයට විදුලි ජනක යන්ත්‍රයක් පිරිනැමීම
6. තරුණ පෙල සඳහා වූ තොරතුරු තාක්ෂණ පරිගණක පාඨමාලාව විවෘත කිරීම
7. පුස්තකාලය නවීකරණය වීම
8. විද්‍යානුකූල මැහුම් පාඨමාලාව
9. නව යොවුන්වියේ දූ දරුවන් සඳහා වන “නිපුනතා සවිය” වැඩසටහන
10. අතුරු කාරක සභා කාර්ය පටිපාටි සම්පාදනය
11. භාණ්ඩ සමීක්ෂණය
12. වාර්ෂික චාරිකාව
13. වෙබ් අඩවිය නිර්මාණය
14. සංස්කාරක මණ්ඩලය
15. ආධාර දර්ශනය
16. මාධ්‍ය කමිටුව
17. අරමුදල් සම්පාදක කමිටුව පිහිටුවීම
18. අප අතරින් වියෝවූ සාමාජිකයින් සිහිපත් කිරීම
19. ආගමික හා කාන්තා අභිවෘර්ධිය පිළිබඳ අතුරු කාරක සභාව
    - 19.1. දහම් දැනුම වැඩසටහන
    - 19.2. අපේක්ෂා රෝහලේ බෝධිය අභියස පැවැත්වෙන් වෙසක් බෝධි පූජාව හා ධර්මදේශනාව
    - 19.3. ශීල භාවනා ත්‍රෛයි මාසික වැඩසටහන
    - 19.4. තුසිත වැඩිහිටි නිවාසයේ දානය
    - 19.5. එක්දින චාරිකාව
    - 19.6. සුවපත් සඟුන් හා දැනුවත් බොදු දරුවෝ
    - 19.7. රාත්‍රී ආහාර පොල
20. සමාජ සේවා හා සමාජ සංවර්ධන පිළිබඳ අතුරු කාරක සභාව
    - 20.1. කිරි අම්මාවරුන්ගේ දානය
    - 20.2. ආයුර්වේද වෛද්‍ය සායනය
    - 20.3. වාර්ෂික ලේ දන්දීම
    - 20.4. දිවයිනේ දුෂ්කර පලාත් වල විහාරස්ථාන වලට අත්‍යාවශ්‍ය භාණ්ඩ පිරිනැමීම
    - 20.5. ගැබිණි මවුවරුන්ට පෝෂණ මළු පිරිනැමීම
21. අධ්‍යාපන හා දැනුම දියුණු කිරීම පිළිබඳ අතුරු කාරක සභාව
    - 21.1. ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන
    - 21.2. අතුරු කාරක සභාව සඳහා අරමුදල් ප්‍රවර්ධන වැඩසටහන
    - 21.3. සිසු සවිය
    - 17.3. අධ්‍යාපන සවිය
22. නිමාව හා පැතුම

# 2019 සංවත්සර ප්‍රගති වාර්තාව

2019 පෙබරවාරි 24 දින පත් වූ නිලධාරි මණ්ඩලය, සංගමයේ සාමාජිකයින් ශුභ පතන්නන් හා පරිත්‍යාගශීලින්ගේ සහාය ලබමින් වර්ෂය තුල ඉටු කරන ලද කාර්ය භාරය පිලිබඳ සවිස්තර වාර්තාවක් වසර අවසානයේ ඔබ අතට පත් කිරීමට අදහස් කරන්නෙමු.

අප සංගමය වෙනත් සංවිධාන හා සැසඳීමේදී ආගමික වශයෙන් මෙන්ම සමාජ සේවාව අතින් ද විශාල කාර්ය භාරයක් සමාජයට ඉටු කර දී ඇති බැවින් ඔබ සැමගේ ආත්ම තෘප්තිය උදෙසාත් ඉදිරි වර්ෂය සඳහා ගුණාත්මක පෙළඹවීමක් ලබාදීම උදෙසාත් මෙම සටහන පිටුවහලක් වනු ඇතැයි විශ්වාස කරන්නෙමු.

## 1. පිළිකා රෝගින්ගේ ශුභ සාධන ව්‍යාපෘතිය

සංගමයේ ප්‍රධානතම ව්‍යාපෘතිය ලෙස 2010 වසරේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මේ වන විට ශ්‍රී ලංකාව පුරාම විසිරී ගිය කීර්තිනාමයක් උරුම කර ගනිමින් ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානයට ලක් වූ ව්‍යාපාතියක් බවට පත්ව තිබේ. මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට 2019 වසර අවසානය වන විට පැමිණ රෝගින් හා භාරකරුවන් සංඛ්‍යාව 46990 ක් ලෙස ලේඛන ගතව තිබේ. එය ඉකුත් වසරට වඩා 6000 ක් වැඩි වීමකි. මෙම වසරේ මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේදී අපට විඳ දරා ගැනීමට සිදු වූ දුෂ්කරතා වෙන වසර වලට වඩා බැරෑරුම් විය. වසර පුරා රට තුල උදාවූ ගැටළු මත ආහාර ද්‍රව්‍ය වල මිල ඉහලයාම, රෝගින් හා භාරකරුවන් සංඛ්‍යාව ඉහල යාම, ජීවන වියදම ඉහලයාම මත ලැබෙන පරිත්‍යාග අඩුවීම අපට බලවත් ලෙස දැනෙන්නට විය. එහෙත් අප විසින් විවිධ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් මෙම තතත්වයනට සාර්ථකව මුහුණ දෙන්නට අපට හැකිවිය. මෙම බැරෑරුම් අවස්ථාවේ අපට සහාය වූ සාමාජිකත්වයට, පරිත්‍යාගශීලින්ට හා කැපවීමෙන් කටයුතු කළ කාර්ය මණ්ඩලයට ද ස්තූතිය පිරිනැම්මට මෙය අවස්ථාවක් කර ගන්නෙමු.

ව්‍යාපෘතියේ රෝගින්ගේ ඇඳන් වල දැල් පහත්වීම මත ඉස්මතු වූ දුෂ්කරතාවය වෙනුවෙන් ඒ සඳහා පී.අයි. හතරැස් බට සවි කිරීමෙන් ද සංවිධානය කල ශ්‍රමදානය සඳහා සහභාගි වූ සාමාජිකයින් වාට්ටු වල පවිත්‍රතාවය රැක ගැනීම සඳහා ලබා දුන් සහයෝගය ඉතාමත් වැදගත් පිටුවහලක් විය. මෙම කටයුතු වලදී පිළිකා රෝගින්ගේ මෙහෙයුම් කමිටුව කළ කැපවීම අගය කරන අතර රෝගින් සඳහා සපයන කොට්ට වල පැරණි උර ඉවත් කර ඒ සඳහා අළුත් උර යෙදීමට පියසීලි ඉලේපෙරුම මහත්මිය රෙදි සැපයීමෙන් ද කොට්ට උර මැසීමට දායක වූ මල්ලිකා විජේසේකර හා වසන්ති වික්‍රමසිංහ යන මහත්මීන් දැක් වූ සහාය ද මෙහිලා විශේෂයෙන් සටහන් කරන්නෙමු.

ව්‍යාපෘතිය ඉකුත් වසර තුල ලද පරිත්‍යාග ගිණුම් වාර්තා තුලින් පහත සඳහන් පරිදි දැක්වීමට අදහස් කරන්නෙමු. ජාතික රූපවාහිනී සංස්ථාවේ කාර්ය මණ්ඩලය නොමිලයේ ප්‍රචාරක කටයුතු කරමින් දැක් වූ සහාය ද කෘතඥතාපූර්වකව සටහන් කරන්නෙමු. මෙම වැඩපිළිවෙලට ලද ආධාර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දාන සඳහා ලද මුදල් ආධාර | රු | 2862521.00 |
| පරිත්‍යාග ලෙස වියළි ආහාර | රු. | 223615.00 |
| සපයන ලද පිසූ ආහාරවල වටිනාකම | රු. | 339500.00 |
| පරිත්‍යාග ලෙස ලද ගෑස්වල වටිනාකම | රු. | 54100.00 |
| එකතුව | රු. | 3479736.00 |

## 2. පිළිකා රෝගින්ගේ ශුභ සාධන ව්‍යාපෘතිය හා බැඳුනු කැට ආධාර ව්‍යාපෘතිය

සංගමයේ පිළිකා රෝගින්ගේ ශුභ සාධනය සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයා ගැනීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහනේ ක්‍රියාකාරී සහාය මුළුමනින්ම සාමාජිකයින් අතින් සිදුකෙරේ. පෞද්ගලික ව්‍යාපාරික ස්ථාන, මහරගම හා අවට

බැංකු ඔසුසල් වැනි රාජ්‍ය ආයතන වල සහාය ලබමින් කැට කමිටුව විසින් මෙම ආදායම් ව්‍යාපෘතිය පවත්වාගෙන යයි. වෙහෙසකාරී මෙහෙවරක නිරත වන කැට කමිටු සාමාජික පිරිස සංවිධානාත්මකව පවත්නා අවදානම් සහගත බව ද නොතකා මහරගම, නුගේගොඩ, කොළඹ, පිළියන්දල වැනි ආසන්න නගර වල සැරිසරමින් ඉටුකරන කාර්ය භාරය නිරතුරුවම සංගමයේ පැසසුමට ලක්වේ.

2019 වසර පුරා විටින් විට පැතිර ගිය කාලගුණික වෙනස්වීම්, ජාතිවාදි අර්බුද, ආරක්ෂාව බිඳ වැටීම් තුලින් ජනතාවගේ ආර්ථිකය දුර්වලවීම හා භාණ්ඩ මිල ඉහල යාම මත පරිත්‍යාග කෙරෙන මුදල් අල්පවීම මත අපට ද යම් යම් අවශ්‍යතා සඳහා ලැබෙන පරිත්‍යාග ප්‍රමාණය ඉකුත් වසරට වඩා ලක්ෂ තුනක් පමණ අඩුවිය. ඉකුත් වසරේ එම කමිටුව කැට 136 ක් ස්ථාන ගත කර රු.1639272.65 ක් උපයා ගත් අතර 2019 වසරේකැට 124 ක් ස්ථාන ගත කරමින් උපයා ගනු ලැබුවේ රු.1377890 ක් බව සංඛ්‍යා ලේඛන වලින් සනාථවේ. කෙසේ වෙතත් මේ මට්ටමින් පවත්වා ගැනිමට ඔවුන් කළ කැපවීම නැවත වරක් අගය කරමින් ස්තුතිය පිරිනැමීමට අවස්ථාවක් කර ගන්නෙමු.

## 3. ඖෂධ සහන සැලසීම

2012 වසරේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබුවේ අප ආයතනයේ නේවාසිකව ප්‍රතිකාර ලබන අඩු ආදායම් ලබන දුෂ්කර පලාත් වල රෝගීන්ට පිළිසරන වීමේ අරමුණෙනි. බොහෝ අවස්ථාවල අවශ්‍ය ඖෂධ රෝහලේ හිඟවන අතර රෝගීන්ට දක්වන සහනයක් ලෙස අප සංගමය විසින් අවශ්‍ය ඖෂධ මිලදී ගෙන රෝගීන්ට පරිත්‍යාග කරනු ලබයි. රෝහලේ ඖෂධ හිඟවන අවස්ථාවල රෝගීන් සඳහා දක්වන සත්කාරය රෝගීන්ගේත් ඔවුන්ගේ භාරකරුවන් අතරත් අතිශයින් ජනප්‍රියව පවතී. මෙම වසර තුල රෝගීන් සඳහා පිරිනමන ලද ඖෂධ වල වටිනාකම රු.83862.00 වේ.

අප සංගමයේ සාමාජික ජයන්ත විජයවීර මහතාගේ පෞද්ගලික කැපවීම මත මෙම සත්කාරක සේවාව දියත් කර ඇති අතර මේ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන එතුමා විසින් සපයනු ලබයි. මෙහි විශේෂත්වය වනුයේ ද එයයි. විදේශීය රැකියාවල නිරත වූවන් හා මේ වන විට දේශීය පරිත්‍යාගශීලීන්ගේද සහාය ලබා ගැනිමට ද ඔහු සමත්ව සිටී. මේ සඳහා අප දක්වන ප්‍රචාරය මත ද පරිත්‍යාග ලැබෙමින් පවතී. ජයන්ත විජයවීර මහතා සිදු කරනු ලබන මෙම මහඟු පුණ්‍යකර්මය අප මහත් සේ අගය කරමින් ගෞරවය හිමි කරන්නෙමු. මෙම වසරේ ඊට ලැබු මුදල රු.161100.00 බව සතුටින් සඳහන් කරන්නෙමු.

## 4. සංගමයේ රීති මාලාව සංශෝධනය හා නැවත මුද්‍රණය

සංගමයේ ක්‍රියාකාරීත්වයට බලය ලැබෙන පාර්ලිමේන්තු පනතට අනුකුලව රීති මාලාවක් ක්‍රමවත්ව සකස් නොවීමේ අඩුපාඩුව පියවා ගැනිම මෙහි මූලික අරමුණ විය. අප අපේක්ෂා නොකල ආකාරයෙන් සංගමයේ කාර්ය භාරය පුළුල්වීම සාමාජිකත්වය සංඛ්‍යාත්මකව වර්ධනය වීම මේ සඳහා බලපාන ලද කරුණු විය. සංගමයේ කීර්තිනාමයට උචිත ලෙස සංගමයේ කොඩිය, සංගමයේ ගීතය, සංගමයේ ප්‍රතිඥාව, සංගමයේ සාමාජික ඉල්ලුම් පත්‍රය, තනතුරු සඳහා නාම යෝජනා පත්‍රය වැනි කරුණු පවා ඇතුලත්ව කිසිදු අඩුවක් නොමැතිව මෙම රීති මාලාව අලංකාරවත් මුද්‍රණයකින් යුක්තව සකස් කර සංගමයේ 2019 වසරේ තුන්වන කාර්තු සභා රැස්වීමේදී සාමාජිකත්වයට නොමිලයේ බෙදා දෙන ලදි.

මෙම කෘතිය මුළුමනින්ම නැවත විමසා බලා මුද්‍රණයට උචිත පරිදි සකස් කර දුන් අප සාමාජික වසන්ත ඒකනායක මහතාටත් ඊට නොමඳ සහාය ලබාදුන් ගරු සභාපති තිලක් හේරත් මහතාටත් ජයන්ත විජයවීර මහතාටත් සංගමය වෙනුවෙන් කළ කැපවීම අගය කරමින් මෙම සභාවේදී විශේෂ ස්තුතිය පිරිනමනු ලබන බව කෘතඥතා පූර්වකව සඳහන් කරන්නෙමු.

## 5. සංගමයට විදුලි ජනක යන්ත්‍රයක් පිරිනැමීම

පිළිකා රෝගීන්ගේ ශුභ සාධන ව්‍යාපෘතිය වැඩි දියුණුවීමත් සමග ආයතනය පවත්වා ගැනීමේදී විදුලි ජනක යන්ත්‍රයක අවශ්‍යතාවය වඩ වඩාත් දැනෙන්නට විය. රෝගීන් තද බද වන අවස්ථාවල සිදුවන විදුලිය බිඳ වැටීම් වලදී රෝගීන් පත් වන අපහසුතා විදුලි සෝපානය අක්‍රිය වීමෙන් පත්වන අපහසුතා ආරක්ෂාව පිළිබඳ විශ්වාසය බිඳ වැටීම වැනි කරුණු ගණනාවක් මේ තුලින් ජනිත විය.

මේ සඳහා දැඩි අවශ්‍යතාවයක් පැවතුන ද අපට ඒ සඳහා අවශ්‍ය මුදල උපයා ගැනීමට නම් විදේශීය පරිත්‍යාගයක සහාය සෙවීමට වූ පෙළඹවීම මත අප සාමාජික උපාලි සද්ධාසේන ද සොයිසා මහතා ඕස්ට්‍රේලියාවේ මෙල්බන්හි පදිංචි සිය හිතවතකු වූ ඩබ්.හේමචන්ද්‍ර මහතා දැනුවත් කිරීමෙන් පසු එතුමා අප සංගමය හා සම්බන්ධව 2019 ක් වූ අප්‍රියෙල් මස 11 වන දින රුපියල් ලක්ෂ 20 ක් වටිනා විදුලි ජනක යන්ත්‍රයක් සංගමයට ලබා දෙන ලදී. මේ සඳහා අපට පෙර සිටම උපකාර කරන ලද ශ්‍රී ලාංකික ප්‍රජාව ද එක්වීම තුලින් එම පරිත්‍යාගය සාමූහික ප්‍රයත්නයක් බවට පත්විය. ඊට දායක වූ සැමට සංගමයේ ගෞරවාදර ස්තූතිය පිරිනමන්නෙමු.

## 6. <u>තරුණ පෙල සඳහා වූ තොරතුරු තාක්ෂණ පරිගණක පාඨමාලාව විවෘත කිරීම</u>

පරිගණක පිළිබඳ සාමාන්‍ය දැනුමක් ඇති තරුණ පිරිසකට උසස් දැනුමක් නොමිළයේ ලබාදෙමින් කර්මාන්තශාලා සඳහා උසස් දැනුමක් සහිත තරුණ පෙලක් බිහි කිරීමේ මෙම වැඩසටහන ආරම්භ කරන ලද්දේ 2019.06.27 වැනි දින අප සංගමයේ සාමාජික මහින්ද කරුණාරත්න මහතා විසිනි. එතුමා කරුණා භාරයේ මුදල් වැය කරමින් අප ගොඩනැගිල්ලේ වායු සමීකරණය කරන ලද කාමරයක අවශ්‍ය වන ලී බඩු උපකරණ ද පරිගණක දහයක් ද සමග දැනුම ලබාදෙන නවතම අංගෝපාංග වලින් සමන්විතව නිර්මාණය කර ඇත. උපදේශකවරයෙකු යොදවා නොමිලයේ ශිෂ්‍ය පිරිස පුහුණු කරන අතර පළමු කණ්ඩායම අවසාන අදියර වන ප්‍රායෝගික පුහුණුවට පිවිස සිටී.

පුහුණුව අවසන් කරන සිසුනට ඉහළ මට්ටමේ වැටුපක් ලබන පරිගණක මගින් මැෂින් ක්‍රියාත්මක කරවන ආයතන වල රැකියා අවස්ථා හිමි කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

මේ සඳහා කිසිදු අයකිරීමකින් තොරව පාඨමාලාව පවත්වන අතර දක්ෂතා වලින් පිරිපුන් ආර්ථික අපහසුතා සහිත දරුවන්ට අනාගතයේ උසස් ජීවන මට්ටමකින් සමන්විත පුරවැසියෙකු බවට පත් කිරීමට මහින්ද කරුණාරත්න මහතා දරණ උත්සාහය බෙහෙවින් අගය කරනුයේ ඒ සඳහා අප සංගමයටද දායක වීමට නිතැතින්ම අවස්ථාවක් උරුම වන බැවිනි.

## <u>07 පුස්තකාලය නවීකරණය වීම</u>

සංගමයේ ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති පුස්තකාලය ආරම්භ වුයේ 2013 වසරේදීය. එහි අරමුණ වුයේ ආගමික සංවිධානයක් ලෙස එහි සාමාජිකයිනට තම දහම් දැනුම වැඩි දියුණුකර ගැනීමට හා ගැටළු නිරාකරණය කර ගැනීමට ඉඩ පහසුකම් සැලසීම සංගමය සතු වගකීමක් බැවිනි ඒ අනුව විමර්ශන පුස්තකාලයක් ලෙස ආරම්භ කළ මෙම පුස්තකාලය සතුව ත්‍රිපිටකය, ශබ්ද කෝෂ, සූත්‍ර දේශනා ඇතුලත් විවිධ පොත් හා පරිශීලනයට සුදුසු පොත් විශාල සංඛ්‍යාවක් රැස්කර තබා ඇත. පොත පත තෝරා ගැනීමේ පහසුව සඳහා නියෝජ්‍ය ලේකම් බී.ජී.කරුණානන්ද මහතා විසින් පොත් සියල්ල පරිගණක ගත කර තබා ඇත.

මෙම කාර්යය පුළුල් කරමින් විවිධ වැඩ සටහන් වලට පැමිණෙන දරුවන්ගේ වැඩිහිටියන් සඳහා සුදුසු කෙටි වේලාවකින් කියවා නිම කල හැකි පොත් ඇතුලත් පොත් රාක්ක හතරක් මහල් හතරෙන් තබා ඇත. ඩී.පී.එල්.වොල්ටර් සිල්වා, එස්.කේ.ගරුසිංහ, පී.රණසිංහ හා එච්.ඩබ්.ඩී.එස්.අබේවික්‍රම යන මහත්වරුන්ගේ ධන පරිත්‍යාගයෙන් මහල් හතරේ පොත් රාක්ක හතරක් තබා ඇත. මෙම ආයතනය නැරඹීමට පැමිණෙන්නන් මෙම පොත් රාක්ක වැඩසටහන ඉහල ඇගයීමකට ලක් කර ඇත. ඒ අනුව ඉතාමත් සාර්ථක පියවරක් බවට පත්ව ඇති බව වාර්තාවේ. දරුවන් සමග පැමිණෙන දෙමාපියන්, දරුවා දරුවාට හිමි කාර්යයේ නිරත වන

අතර දෙමාපියන් කිසියම් පොතක් කියවමින් සිටිනු දැකීම සුලබ දසුනක් බවට පත්ව තිබීම සතුටකි.

පුස්තකාලයේ නවතම පියවර වූයේ පොත් බැහැර දෙන අංශයක් පිහිටුවීමයි. බොහෝ දෙනෙකුගේ ඉල්ලීම් අනුව මේ වන විට බැහැර දීමේ අංශය විවෘත කර තිබේ. සතියේ අඟහරුවාදා දිනවල පෙ.ව. 9.00 සිට 11.00 දක්වා සාමාජිකයින්ට එම පුස්තකාලයෙන් පොත් ලබා ගැනීමට අවස්ථාව සලසා ඇති බව සතුටින් දන්වා සිටිමු.

## 8. විද්‍යානුකූල මැහුම් පාඨමාලාව

කාන්තාවන්ගේ මානසිකත්වය උසස් මට්ටමක පවත්වා ගැනීමට බලපාන හැකියාවක් වැඩි දියුණුකර ගැනීමට ඉවහල් වන පුහුණුවක් ලබාදීමේ අරමුණින් ඔවුනට සහාය වීම සඳහා ආරම්භ කළ ඉහත පාඨමාලව දෙවන වසරට පිවිස සිටී. වරකට කාන්තාවන් 40 කට පමණ පහසුකම් සැලසුවද මේ වන විට සිසුවියන් 50 ක් ඉක්මවා ඇත. ආගමික හා කාන්තා අභිවෘර්ධිය පිළිබඳ අතුරු කාරක සභාවේ සභාපතිනිය වන සුනේත්‍රා සේනානායක මහත්මියගේ විශිෂ්ඨ කැපවීම මත 2019 ජුලි මස 27 දින පැවැත්වූ විලාසිතා දැක්ම වැඩසටහන තුලින් මෙම පාඨමාලාවේ විශිෂ්ඨත්වය මැනවින් ප්‍රදර්ශනය විය. මැහුම් ශිල්පය පිළිබඳ කීර්තිමත් නාමයක් හිමිකර ගෙන සිටින සිතා දේවී වික්‍රමසිංහ මහත්මිය අප සංගමය හා එක්ව කාන්තාවන් සඳහා නොමිලයේ පවත්වන මෙම පාඨමාලාව මාධ්‍ය හරහා ඉහළ ඇගයීමකට ලක් කර ඇති බැවින් දිනෙන් දින පැමිණෙන පිරිස වැඩිවෙමින් පවතී. පාඨමාලාව වෘත්තිය පුහුණු අධිකාරියේ සම්මතයනට අනුව පැවැත්වෙන අතර සාර්ථකව පාඨමාලාව නිම කරන සිසුනට NVQ /4 සහතිකය ලබාදෙන බැවින් ඊට වෘත්තියමය වටිනාකමක් උරුම කර දී ඇත.

## 9. නව යොවුන් වියේ දූ දරුවන් සඳහා වන "නිපුණතා සවිය" වැඩසටහන

සංගමයේ නවතම ව්‍යාපෘතිය මෙයයි. තමාගේ කටයුතු තමාම කර ගැනීමට හැකියාව උරුම කරදෙන පළමු කණ්ඩායම අවසන් අදියරට පැමිණ සිටී. මෙම පාඨමාලාවේ දී බාලක/බාලිකා හැමටම ප්ලග් හා ප්ලග් බේස් ගලවා සවිකිරීම, බල්බ් වැලක් සකස් කිරීම හා සිවිලිමට සවිකර ඇති විදුලි පහනක කොටස් ගලවා සවි කිරීම බල්බයක් මාරු කිරීම වැනි කටයුතු ආරක්ෂිතව කිරීමට පුහුනුව ලබාදේ. එසේම අපතේ යන ද්‍රව්‍ය වලින් නිවසට අවශය දෑ නිර්මාණය හා ජලනල කාන්දුවීම් වලකා ගැනීමටත් නව සම්බන්ධතා යොදා ගැනීම වැනි දේ පිළිබඳවත් පුහුණුවක් ලබා දීමට නියමිතය.

මෙම පාඨමාලාව පවත්වාගෙන යාම සඳහා ජර්මන් කාර්මික ආභ්‍යාස ආයතනයේ පුහුණුව ලත් තරුණ පිරිසක් හා ගුරු සේවයෙන් විශ්‍රාම ලත් ගුරුවරුන්ගේ සහායද අපට හිමිව තිබේ. මේ තුලින් නිවසේ සරල අවශ්‍යතා පිරිමසා ගැනීමටත් ඉදිරි ජීවිතයේදී නිවසේ අවශ්‍යතා වලින් සැහෙන ප්‍රමාණයක් තමන් විසින්ම ඉටුකර ගැනීමට අනාගත පරපුරට ශක්තිය ලබා දීම අපගේ අරමුණ බව සඳහන් කරනු කැමැත්තෙමු.

## 10. අතුරු කාරක සභා කාර්ය පටිපාටි සම්පාදනය

වසරකට අප සංගමය ඉටුකරන වැඩසටහන් වලින් 60%ක් පමණ ඉටු කරනු ලබනුයේ අතුරු කාරක සභාව වලිනි. මේ අනුව මෙම අතුරු කාරක සභා හතරෙහිම ශක්තිමත් බව රැඳී පවතිනුයේ ඒ සඳහා බලය පැවරෙන කාර්යය තුලිනි. මේ තුලින් එක් එක් අතුරු කාරක සභා නිලධාරීන් පත්වීම. සාමාජිකයන් පත්වීම ඔවුන් සතු වගකීම් හා පරිපාලන අරමුදල් සම්පාදනය හා හැසිරවීම වාර්තා කිරීම අනුමැතිය ලබා ගැනීම වැනි සියළු පරිපාලන රටාවන් ඇතුලත් කර ඒ ඒ අතුරු කාරක සභාව විසින් සම්පාදනය කරන ලද සැලසුම් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව ඇති කරගත් එකඟතාවයෙන් පසු 2019 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට සම්මත කර තිබේ. මේ අනුව වඩාත් ශක්තිමත් පදනමක් මත ක්‍රියාත්මක වීමට අතුරු කාරක සභාවලට ශක්තිය හා ආත්ම විශ්වාසය හිමිවනු ඇත.

## 11. භාණ්ඩ සමීක්ෂණය 2019

2019 වසරට අදාලව පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණය ජුලි මස 06 වනදා කණ්ඩායම් 5 ක් යටතේ සිදු කරන ලදී. ආරම්භයේ සිට දෙවන හා තෙවන මහල් වල උපකරණ ලේඛන ගත නොවීම මත එය සකස් කිරීම මෙහි මූලික අරමුණ විය. මේ වන විට සියළු වාර්තා භාණ්ඩාගාරික මහතා හා නියෝජ්‍ය භාණ්ඩාගාරික මහතා විසින් ලේඛන ගත කොට අවසන් කර තිබේ.

මෙම කාර්යය සාර්ථකව අවසන් කර ගැනීම සඳහා සංගමයේ සාමාජික මහත්ම මහත්මන් ගෙන් ලද සහාය වෙනුවෙන් ඔවුන් හැමදෙනා වෙතම ස්තුතිය පිරිනමන්නෙමු.

## 12. වාර්ෂික චාරිකාව

වාර්ෂිකව සංවිධානය කරන චාරිකාව මෙම වසරේ නොවැම්බර් 30 හා දෙසැම්බර් 01 යන දිනවල පැවැත්වෙන මෙම චාරිකාව දකුණු පළාත කේන්ද්‍ර කර ගනිමින් එහි පැරණි සිද්ධස්ථාන නැරඹීම අරමුණ විය. ඒ අනුව අධිවේගී මාර්ගය හරහා මාතර දෙවුන්දර, ප්‍රදීපාගාරය, දෙවුන්දර, උපුල්වන් දෙවි මැදුර, වෙහෙරහේන පූර්වාරාම විහාරය, වැවුරුකන්නල විහාරස්ථානය, මුල්කිරිගල, කසාගල, නයිගල විහාරස්ථාන කතරගම සිතුල්පව්ව, මත්තල ගුවන්තොටුපල චාරිකාවේ සැලසුම් කල ස්ථාන විය. රාත්‍රිය කතරගම නේවාසිකාගාරයක ගත කරන ලදුව දෙවන දිනය ඇරඹුයේ සිතුල් පව්ව රජමහා විහාරය බලා ගමන් ඇරඹීමෙනි.

චාරිකාවට සාමාජිකයින් 45 කු සහභාගි වූ අතර දින දෙකෙහිදිම පස්වරුවේ ඇද වැටුනු වර්ෂාව හේතුවෙන් නියමිත වේලාවට ගමනාන්තයට ළගාවීම අපහසු විය. එහෙත් සුපුරුදු පරිදි මෙම චාරිකාව එස්.කේ.ගරුසිංහ හා ලක්ෂ්මන් ධර්මප්‍රිය යන මහත්වරුන්ගේ කැපවීම මත විනෝද චාරිකාව සාර්ථක කර ගැනීමට අපට හැකිවිය. පලමු දින දිවා ආහාරය සංවිධානය කරදීමෙනුත් දෙවන දින පස්වරුවේ තේ පැන් සංග්‍රහයක් සංවිධානය කර දීමෙනුත් වසන්ත ඒකනායක මහතා දැක්වූ අනුග්‍රහය ස්තුතිපූර්වකව සිහිපත් කරන්නෙමු. ඒ අනුව මෙම චාරිකාව සාර්ථක කර ගැනීමට විවිධ අයුරින් දායක වූ සැමට ස්තුතිය පිරිනමන්නෙමු.

## 13. වෙබ් අඩවිය නිර්මාණය

සංගමය සඳහා වූ වෙබ් අඩවියක් ප්‍රථමයෙන් අප සාමාජික ඩී.කේ.හෙට්ටිආරච්චි මහතා නිර්මාණය කර දීමෙන් පසු යලිත් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ පදිංචි ගිහාන් සිල්වා මහතා සිය පරිත්‍යාගයක් ලෙස යලිත් වෙබ් අඩවියක් නිර්මාණය කර ක්‍රියාත්මක කරමින් සිටිය දී වසර කීපයකට පසු අපට පාලනය කළ නොහැකි හේතුවක් මත අක්‍රිය වීම අනුව එහි සේවය අපට අහිමි විය. නැවත වරක් එය ක්‍රියාත්මක තත්වයකට ගෙන ඒම සඳහා මිළ ගණන් කැඳවීමෙන් අනතුරුව "වෙබ් ලංකා" ආයතනයට වගකීම් පවරා දී මේ වන විට අඩියරෙන් අඩියර ක්‍රියාත්මක කරමින් සිටී.

මේ සඳහා අවශ්‍ය පරිදි කටයුතු කිරීමට කමිටුවක් ලෙස පී.ටී.සිරිසේන, ජයන්ත විජයවීර හා බී.පී.කරුණානන්ද යන මහත්වරුන් පත් කර ඇත. එය තව නොබෝ දිනකින් ක්‍රියාත්මක තත්වයට පත් කර ගත හැකිවේ යයි අප විශ්වාස කරන්නෙමු.

## 14. සංස්කාරක මණ්ඩලය

සංගමය වාර්ෂිකව නිකුත් කරන ප්‍රකාශන අතර "අර්ථ සාදනී" සඟරාව මුල් තැනක් ගනී. අප සංගමයට එක් වූ වටිනාම සම්පතක් වන ලීලාරත්න කංකානම්ගේ මහතාගෙන් මේ සඳහා හිමිවන සහාය මිළ කළ නොහැකිය. එතුමා ලේඛක ප්‍රජාව හා සම්බන්ධව වෙමින් හරවත් ලිපි එකතුවක් සඳහා කරන කැපවීම තුලින් මෙම වසරේ දී අර්ථ සාදනී 2019 කලාපය සැලසුම් කරමින් සිටින අතර ඒ සඳහා අපට පාලනය කල නොහැකි බාධක ද නැතුවා නොවේ. සමාජය සිසාරා පැතිර යන ආර්ථික ගැටළු මේ සඳහා අපට ද බලපා තිබේ.

ඒ අනුව ඉදිරි කාලය තුල විසඳා ගැනීමට අපේක්ෂිත මෙම බාධක හඳුනා ගනිමින් ඉදිරි වසර තුල එම ක්‍රියාවලිය ඔපවත් කරමින් අත්දැකීම් බහුල බුද්ධිමත් සාමාජික පිරිස ලේඛන කලාවට අතහිත දෙමින් මෙම ප්‍රකාශන දොරට වැඩීමට අපට ශක්තියක් වෙතැයි අප විශ්වාස කරන්නෙමු.

## 15. ආධාර දර්ශනය

සංගමයේ පරිපාලන අරමුදල සඳහා මෙම වසරේ වේදිකා ගත කරන ලද නාට්‍ය දර්ශනය 2019 අගෝස්තු මස 16 වන දින මහරගම තරුණ සේවා සභා රඟහලේ දී වේදිකා ගත විය. ප්‍රසිද්ධ නාට්‍ය රචකයෙකු වූ රවීන්ද්‍ර ආරියරත්නයන්ගේ "වරිතේ හොරු අරං" නාට්‍යය මෙවර වේදිකා ගත විය. මෙම ආධාර දර්ශනයෙන් ලද ආදායම රු. 6,66076/- ක් විය. මෙම වකවානුව තුල රටෙහි පැවැති අයහපත් වාතාවරණය තුල ටිකට් පත් අලෙවිය අසතුටු දායක වෙතැයි විශ්වාසයක් පැවැතිය ද එය එසේ නොවීය. සංවිධායකයන්ගේ කැපවීම, බොහෝ සාමාජිකයන්ගේ උත්සාහය වෙළඳ දැන්වීම් හා විශේෂ ආධාර ලැබීම් ඉහළ මට්ටමක පැවැතීම මෙසේ ආධාර ලැබීමට හේතු විය.

සංගමයේ දියත් කරන විශේෂ ව්‍යාපෘති වල හා සමාජ සත්කාරක ව්‍යාපෘති වල උසස් මට්ටම හා සාධාරණත්වය මෙසේ ආධාර ලැබීමට හේතුවන්නට ඇතැයි අප විශ්වාස කරන්නෙමු. මෙම ආධාර දර්ශනයේදී ගරු සභාපති තිලක් හේරත් මහතාගේ මනා සංවිධානය හා කැපවීම අතිශයින් අගය කළ යුතු බව විශේෂයෙන් සටහන් කරන්නෙමු.

## 16. මාධ්‍ය කමිටුව

සංගමය අනුගමනය කරන ලද වැඩසටහන් හා සත්කාරක සේවා සමාජ ගත කිරීම සඳහා මෙම මාධ්‍ය අනුග්‍රහය වටිනා සේවාවන් ඉටු කරන ලදී රජත ජයන්ති උත්සවය සමඟ අප හා එක් වූ මාධ්‍ය කමිටුව ජීවයක් ලැබුවේ අප හා එක්වූ ප්‍රවීණ මාධ්‍යවේදී සිරිසේන තුඩුවගේ මහතාගේ ක්‍රියාකාරී සත්කාරක සේවාව තුලිනි.

සංගමයේ සියළුම සේවාවන් හා සත්කාරක මෙහෙවරයන් එතුමා ජායාරූප ගත කරමින් හා වීඩියෝ තාක්‍ෂණය ඔස්සේ බොහෝ මාධ්‍ය ආයතන වලට බෙදා දෙමින් පුවත්පත් හා රූපවාහිනී සේවා තුලින් ප්‍රචාරය කිරීමට කටයුතු සලසා ඇත. සංගමයේ කීර්තිමත් සාමාජිකයෙකු ලෙස එතුමාගෙන් සංගමයට ඉටුවන සේවාවන් සඳහා හැමගේ ස්තූතිය පිරිනමන්නට මෙය අවස්ථාවක් කර ගන්නෙමු.

## 17. අරමුදල් සම්පාදන කමිටුව පිහිටුවීම

2019 වසර අපූර්වතම සිදුවීම් ගණනාවක් සමාජ ගත වූ වර්ෂයක් විය. ඇතැම් සිදුවීම් සමාජය උඩු යටිකුරු කරන්නට තරම් බලවත් විය. නිසංසලාව ගලා ගිය දිය පහරක් හදිසියේ දෙගොඩ තලා යන්නට වුවාසේ නිහඬ දිවිපෙවෙතක් ගෙවූ සමාජය දෙදරා යමින් අඛණ්ඩ තදවැසි නායයාම් හා සමාජයේ ජාතිවාදී ගිණි පුළිඟු දල්වමින් කුරිරු බවට පත්විය. මේ නිසාම ආහාර ද්‍රව්‍ය රැකියා අවස්ථා අහිමි විය. ආදායම් මාර්ග ඇනහිටින ලදී. මිනිසුන් අත මිළ මුදල් හිඟ විය. දනට පිනට ලැදිවූ ජනතාව ආර්ථික අහේනිය මත ඉන් පසුබා ගියේය. ඒවායේ අතුරු ප්‍රථිපල ලෙස අප ආයතනය වැනි ආයතන වලට පරිත්‍යාග හිඟ විය. මේ නිසා අරමුදල් සම්පාදනය කර ගැනීමේ මාර්ග සොයන්නට විය. එහි ප්‍රතිඵල ලෙස ක්‍රියාකාරී සමාජය තුළින් මුදල් උපයා ගැනීමට ඉදිරි වසර සඳහා ගොනුකල ක්‍රියාකාරකම් නව වසරේ පත්වන නිලධාරී මණ්ඩලය විසින් ඔබ හමුවට ගෙන එනු ඇත.

## 18. අප අතරින් වියෝවූ සාමාජිකයින් සිහිපත් කිරීම.

වසරක් පාසා සංගමය විසින් අප අතරින් සමුගත් සාමාජිකයින් සිහිපත් කිරීම පුණ්‍යානුමෝදනාපූර්වකව සිදු කරන්නෙමු. කිසිදු අරමුදලක් අප සතුව නොතිබුනු අප සංගමය අද පවත්නා තත්වයට ගෙන එන්නට තරම් ශක්තිමත් වූයේ ඔබ වැනි අප අතරින් සමුගත් පිරිසකගේ ද දහදිය කඳුළු හා දුක් කඳුලු මැදිනි. ඒ අනුව අද සංගමය, සෙවන සලසන අතු පතර සිසාරා වැඩුණු සුවිසල් වෘක්‍ෂයක් වැනිය. ඉන් දසත පැතිර යන ගුණ සුවඳ ලොව සදා සුවඳවත් කරනු ඇත.

මෙම වසරේ දී දෙසැම්බර් 28 හා 29 දෙදින පරිත්‍රාණ ධර්ම දේශනයක් හා සංඝරත්නය දස නමක් විෂයයෙහි සපිරිකර සගසතු දානමය පිංකමක් පවත්වා ඒ සැමට පිං පමුණුවන ලදී. මෙම වසර වන විට සාමාජිකයින් 52 ක් අප අතරින් සමුගෙන තිබූ අතර සෑම වසරකම දෙසැම්බර් මස මෙම පුණ්‍යකර්මය සිදු කිරීමට නියමිතය.

## අතුරු කාරක සභා වාර්තා

## 19. ආගමික හා කාන්තා අභිවෘර්ධිය පිළිබඳ අතුරු කාරක සභාව

මෙම අතුරු කාරක සභාවේ සභාපතිනිය ලෙස සුනේත්‍රා සේනානායක මහත්මිය ද, ලේකම් ලෙස සී.පලිහක්කාර මහත්මිය ද, භාණ්ඩාගාරික ලෙස සුමිත්‍රා පෙරේරා මහත්මිය ද කටයුතු කරන ලදී.

### 19.1. දහම් දැනුම වැඩසටහන

මේ යටතේ සංගමය දීර්ඝ කාලයක් තුල සෑම මසකම පළමු ඉරුදින මෙම වැඩසටහන අඛණ්ඩව පවත්වන ලදී. ඉතා ක්‍රමවත් හා සංවිධානාත්මකව පැවැත්වීමට ලැබීම සතුටකි. ඉන් සාමාජික සාමාජිකාවන්ගේ දහම් දැනුම වර්ධනය සඳහා ලැබෙන පිටුවහල ඉතා වැදගත් විය.

මේ අයුරින් ධර්ම දේශනා දොලහක් වර්ෂය තුල පැවැත්වීමට හැකිවිය. මෙම දේශනවල දේශකයාණන් වහන්සේ අතුරු කාරක සභාව විසින් වැඩම කරවන අතර තවත් විටෙක දායකත්වය දරන්නා විසින් ද සිය කැමැත්ත පරිදි දේශකයාණන් වහන්සේ වැඩම කරවන ලදී. ඒ අනුව විවිධත්වයකින් යුතුව දේශකයාණන් වහන්සේලා වැඩම කරවීමට හැකිවිය. කෙසේ වෙතත් ඉකුත් වසර තුල ඉතා ක්‍රමවත් වැඩපිළිවෙලක් මේ තුලින් සැලසුම් විය.

### 19.2. අපේක්ෂා රෝහලේ බෝධිය අභියස පැවැත්වෙන වෙසක් බෝධි පූජාව හා ධර්මදේශනාව

සංගමය පවත්වාගෙන යන පිළිකා රෝගීන්ගේ ශුභ සාධන ව්‍යාපෘතියට සමගාමීව අප අතුරු කාරක සභාව සෑම වසරකම අපේක්ෂා රෝහලේ බෝ සමිඳුන් අභියස බෝධි පූජාවක් හා ධර්මදේශනාවක් පවත්වා නේවාසික රෝගීන්ට සෙත් පැතීම සිදු කරනු ලබයි. මෙම වසරේ මැයි මස 12 වන දින එම පූජාව සිදු කල අතර මහරගම ධර්මායතනවාසී බංගලාදේශයේ ධර්මපාල හිමිපාණන් මෙම පූජාව පවත්වන ලදී. අවසානයේ සියළු රෝගීන්ට ඉක්මන් සුවයත් කාර්ය මණ්ඩලයට හා වෛද්‍යවරුන්ට නිදුක් නිරෝගි සුවයත් ප්‍රාර්ථනා කරන ලදී.

### 19.3. ශීල භාවනා ත්‍රෛයි මාසික වැඩසටහන

උදෑසන 7.00 ට සිල් සමාදන් වීමෙන් අනතුරුව භාවනානුයෝගීව පස්වරු 5.00 දක්වා ශීලයෙහි පිහිටා පවත්වන මෙම වැඩසටහන වසරකට තුන්වරක් සංවිධානය කෙරේ. සහභාගි වන සියළු දෙනාට හිල් දානය හා දහවල් දානය පිරිනැමීම ද අතුරු කාරක සභාව විසින් සිදු

කෙරේ. වැඩසටහන සිදු කරනු ලබනුයේ පූජ්‍ය බලන්ගොඩ ආනන්ද චන්දකීර්ති හිමිපාණන් විසිනි. භාවනාව පිළිබඳ ප්‍රායෝගික කොටස් ඇතුලුව සිදු කෙරෙන මෙම වැඩසටහන සංගමයේ බොහෝ දෙනෙකු සහභාගි වන වැඩසටහනකි. 2019 වසරේ මාර්තු 24, ජුලි 28 හා නොවැම්බර් 23 යන දිනවල වැඩසටහන් ක්‍රියාත්මක විය.

## 19.4. තුසිත වැඩිහිටි නිවාසයේ දානය

ඉතා දිඟු කාලයක් ඔස්සේ සිට වාර්ෂිකව පිරිනමන මෙම දානය සෑම වසරකම අගෝස්තු මස 17 වන දින පැවැත්වේ. දවසේ වේල් තුනම සඳහා දායකත්වය පිරිනමමින් බොහෝ පිරිසක් මෙම දානයට සම්බන්ධවේ. අවශ්‍යතා කලින් සම්පූර්ණ කර ගනිමින් එදින උදෑසන පොල්ගස්ඕවිට තුසිත වැඩිහිටි නිවාසය බලා යන පිරිස උදෑසන ආහාරය පිරිනමා ඉක්බිති සියළුදෙනා එක්ව දහවල් දානය පිළියෙල කෙරේ. මෙම දානයට සෑම වසරකම මෙන් අනුග්‍රහය දක්වනුයේ එච්.සෝමදාස මහත්මියත් නීතා විජේතුංග මහත්මියත් පී.ටී.සිරිසේන මහතාත් ඉතා මැනවින් සිදු කරති. දහවල් බුද්ධ පූජා වැඩසටහන හා පුණ්‍යානුමෝදනා පැවැත්වීමෙන් අනතුරුව වැඩිහිටියන් සඳහා දිවා ආහාරය පිරිනැමේ. රාත්‍රී ආහාරවේලට අදාල කටයුතු සම්පාදනය කිරීමෙන් අනතුරුව දවසේ කටයුතු නිමාවට පත්වේ. එමෙන්ම සාමාජිකයින් දානයේ කටයුතු සඳහා අනුග්‍රහය දක්වමින් ද ශ්‍රමය කැප කිරීමෙන් ද සහභාගි වීමෙන් ද දක්වන උනන්දුව අතිශයින් අගය කරන්නෙමු.

## 19.5. එක්දින වන්දනා චාරිකාව

ආගමික අතුරු කාරක සභාව වාර්ෂිකව සංවිධානය කරන මෙම වැඩසටහන මෙවර පාහියංගල කේන්ද්‍ර කර ගනිමින් සංවිධානය විය. සාමාජික සාමාජිකාවන් 20 ක පමණ පිරිසකගෙන් සැදුම්ලත් කණ්ඩායමක් ප්‍රථමයෙන් පාහියංගල ලෙන ආශ්‍රිත පරිසරය හැදෑරීමෙන් අනතුරුව පාහියංගල විහාරස්ථානයට පැමිණ එහි ස්වාමීන්වහන්සේලා බැහැ දැක ඉන් පිටත්ව වරකාගොඩ විහාරස්ථානය නැරඹීය. එම දර්ශනීය විහාරස්ථානය වැඳ පුදා ගනිමින් අනතුරුව ආපසු පැමිණීමේදී හොරණ, දික්හේන "සුව අරණ" විහාරස්ථානයට පැමිණ බක්කුල මහ රහතන්වහන්සේගේ ධාතු තැන්පත් කර ඇති චෛත්‍යය වැඳ පුද ගනිමින් ආපසු මහරගම බලා පිටත්විය.

## 19.6. සුවපත් සඟුන් හා දැනුවත් බොදු දරුවෝ

නියෝජ්‍ය සභාපති ඩී.පී.එල්.වෝල්ටර් සිල්වා මහතාගේ සංකල්පයක් මත ප්‍රථම වරට දියත් කල මෙම වැඩසටහන දෙසැම්බර් 14 වන දින හබරන ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක විය. මේ තුලින් දුෂ්කර ගම්මාන වල විහාරවාසී හිමිවරුනට හදිසි ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන ඖෂධ වර්ග ඇතුලත් පෙට්ටි පිරිනැමීමත් එම විහාරස්ථාන වල පිහිටුවා ඇති දහම් පාසල් වල

දරුවනට අතිරේක කියවීම් සඳහා සුදුසු පොත් 150 ක් පමණ ඇතුලත් පොත් පාර්සලය බැගින් පිරිනැමීමෙන් සිදු කරන ලදී.

මෙම වැඩසටහනේදී තෝරා ගත් විහාරස්ථාන වූයේ පුවක්පිටිය, මඩවල, හල්මිල්ලෑව, මීගස්වැව, කුඹුක් වැව, පලුගස්වැව, හා වායාඋල්පත යන විහාරස්ථානයන්ය. මේ හැම විහාරස්ථානයකටම ඖෂධ පෙට්ටියක් හා පොත් පාර්සලයක් බැගින් පිරිනමන ලදී. එමෙන්ම ඒ හැම ස්ථානයකදීම අප සංගමය පිළිබඳ හැඳින්වීමක් ද අප සංගමයේ සත්කාරක සේවා පිළිබඳ හැඳින්වීමක් ද සිදු කරන ලදී.

## 19.7. රාත්‍රී ආහාර පොල

ආගමික අතුරු කාරක සභාව සිය ව්‍යාපෘති පවත්වාගෙන යාමේදී ඒ සඳහා වැයවන ප්‍රතිපාදන උපයා ගැනීමේ අරමුණින් ද සුහද හමුවක අරමුණින් ද මෙම වැඩසටහන පවත්වයි. රාත්‍රී ආහාරය සඳහා ආප්ප, ඉඳිආප්ප, තෝසෙ, වඩේ, නූඩ්ලස් හා කහබත් ආදිය අලෙවි කිරීමට කටයුතු සලසා තිබුනි. මෙම වැඩසටහන තුලින් රු.72900/- ක ආදායමක් ලැබීමට ඔවුන් සමත් විය.

## 20. සමාජ සේවා හා සමාජ සංවර්ධනය පිළිබඳ අතුරු කාරක සභාව

මෙම අතුරු කාරක සභාවේ සභාපති ලෙස කේ.ඒ.පී.කළුආරච්චි මහතා ද, ලේකම් ලෙස ජී.ඩී.ආර්.පෙරේරා මහතා ද භාණ්ඩාගාරික ලෙස එස්.ඒ.ඥානරත්න මහතා ද, කටයුතු කරන ලදී.

## 20.1 කිරි අම්මාවරුන්ගේ දානය

වර්ෂය ආරම්භයේ පවත්වනු ලබන මෙම දානය 2019 වර්ෂයේ ජනවාරි මස 12 වන සෙනසුරාදා දින සිදු කරන ලදී. කිරි අම්මාවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත දානය පිරිනැමීමේ අරමුණ වන්නේ ආයතනය තුල රැඳී සිටින නේවාසික රෝගීන්ට සෙත් පැතීමත්, සංගමයේ සමස්ථ සාමාජික පිරිසට ආශිර්වාද කිරීමත්ය. මේ සඳහා සාමාජික සැමගේ දායකත්වය ලබාදෙන ලදී.

## 20.2 ආයුර්වේද වෛද්‍ය සායනය

මෙම ව්‍යාපෘතිය මාර්තු 23 වන දින බස්නාහිර පලාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරිනියන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් පැවැත්වින. විශාල පිරිසක් සහභාගිවූ මෙම වෛද්‍ය සායනයට පැමිණි සැමගේ රෝග පරීක්ෂාව හා ප්‍රතිකාර ලබා දීම නොමිලයේ සිදු කරන ලදී. වැඩසටහන සාර්ථක වැඩසටහනක් වූ බව සැමගේ විශ්වාසය විය. වැඩසටහන වෙනුවෙන් මැදිහත් වූ අප සාමාජික ජේ.කේ.ගමගේ මහතාටත් වැඩ බැලු ගරු සභාපති සෝමනාත් වෙලබඩ මහතාටත් ස්තුතිය පුද කරමු. ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට ක්‍රියාශීලිව සහයෝගය දැක්වූ සමාජ සේවා අතුරු කාරක සභාවේ සාමාජික සාමාජිකාවන්ගේ සේවය ඉතා අගය කොට සලකමු.

## 20.3. වාර්ෂික ලේ දන්දීම

සංගමයේ ආර්මිභයේ සිටම අඛණ්ඩව ඉතා උනන්දුවෙන් සිදු කරන මෙම වැඩසටහන ජුනි මස 29 වන දිනට ක්‍රියාත්මක කිරීමට සංවිධානය කර තිබුණි. පෙර වර්ෂ වල මෙන්ම සංගමයේ විශාල පිරිසකගේ ආධාර උපකාර ඇතිව ඉතා සාර්ථක ලේ දන්දීමක් පැවැත්වීමට හැකිවිය. මහරගම අපේක්ෂා රෝහලේ වෛද්‍යවරියක් ද කාර්ය මණ්ඩලය ද මේ උතුම් කාර්යයට දායක විය. ඒ සැමට ස්තුතිය පුද කරමු.

මේ වැඩසටහන ආරම්භයේ සිටම වෛද්‍ය කණ්ඩායම ඇතුළු කාර්ය මණ්ලයටත්, අපගේ සාමාජික පිරිසටත් දිවා ආහාරය සැපයූ සංගමයේ ගරු සභාපතිතුමාටත් ලේ පරිත්‍යාගශිලින්ට මාමයිට් පිරිනැමූ සෝමනාත් වෙලබඩ මහතාටත් සමපෝෂ පැකට් ලබා ගැනීමට සහාය වූ මල්ලිකා විජේසේකර මහත්මියටත්, මැලිබන් ආයතනයටත්, යුනිලිවර්ස් සමාගමටත්, විවිධ අයුරින් උදවූ උපකාර කළ සැමටත් අපගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුද කරමු. මෙවර ලේ පරිත්‍යාගශිලින් 110 ක් සහභාගි වූ අතර ලේ පයින්ට් 88 ක් අපේක්ෂා රෝහලට පරිත්‍යාග කිරීමට හැකිවිය.

## 20.4. දිවයිනේ දුෂ්කර පලාත්වල විහාරස්ථාන වලට අත්‍යාවශ්‍ය භාණ්ඩ පිරිනැමීම

වර්ෂ 2019 සඳහා ජනප්‍රිය ව්‍යාපෘතික් වූ මෙම වැඩසටහන තාවකාලිකව නවතනු ලැබීය. එහෙත් මහරගම මහාමේඝාරාමාධිපති බස්නාහිර පලාත් අධිකරණ සංඝනායක ගරු පූජ්‍ය අංකුඹුරේ අමරවංශ නාහිමිගේ යෝජනාවක් පරිදි පරිත්‍යාගයක් වශයෙන් අප කාරක සභාවේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.25000/- මුදලක් හොරොව්පතාන ප්‍රදේශයේ ලේකම් කොට්ඨාශයේ විහාරස්ථානයක් සඳහා ලබාදෙන ලදි. එමෙන්ම දුෂ්කර පලාත් විහාරස්ථානයක් සඳහා ආගමික හා කාන්තා අභිවෘර්ධිය පිළිබඳ අතුරු කාරක සභාව සමඟ ඒකාබද්ධ වී ඖෂධ පෙට්ටි 10 ක් පරිත්‍යාග කිරීමේ මාහැඟි කාර්යයට අප අතුරු කාරක සභාවේ සාමාජික සාමාජිකාවන්ට හැකි විය.

## 20.5. ගැබිණි මවුවරුන්ට පෝෂණ මළු පිරිනැමීම

මහරගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ ඒකාබද්ධ වී ආර්ථික අපහසුතාවයන් සහිත ගැබිණි මවුවරුන් 17 ටත් එක් ළදරුවෙක් වෙත සනීපාරක්ෂක කට්ටලයකුත් පිරිනැමීම නොවැම්බර් මස 09 වන දින බෞද්ධ මන්දිරයේ විපුලි ජයසූරිය ශාලාවේදී අති උත්කර්ෂවත් ලෙස සිදු කරන ලදි. මේ සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ ගරු සභාපති කේ.ඒ.පි.කළුආරච්චි මහතාට ප්‍රණාමය පුද කරන අතර ඊට සහභාගි වූ සංගමයේ ගරු ලේකම් මහතාත් ගරු භාණ්ඩාගාරික මහතාත් ඇතුළු සියළු සාමාජික සාමාජිකාවන් සැමට ද අනුග්‍රාහකභවතුන් සැමට ද ස්තුතිය පිරිනමන්නෙමු.

## 21. අධ්‍යාපන හා සංස්කෘතික අතුරු කාරක සභාව

අධ්‍යාපන අතුරු කාරක සභාවේ ගරු සභාපති වශයෙන් ආචාර්ය කේ. ආරියසිංහ මහතා ද, ලේකම් වශයෙන් පී.ආර්. ලියනගේ මහතා ද, භාණ්ඩාගාරික වශයෙන් අනුර සේනානායක මහතා ද, කටයුතු කරන ලදී.

### 21.1. ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහන

මේ යටතේ මාර්තු 24 වන දින අධ්‍යයන පොදු සහතික පත්‍ර සා.පෙළ සිසුන් 25 දෙදෙනෙකු සඳහා ද උසස්පෙළ සිසුන් 20 දෙදෙනෙකු සඳහා ද ශිෂ්‍යත්ව හිමිකම් සහතික පිරිනැමීම සිදු කරන ලදී. ඊට සහභාගී වූ සිසුන් හා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනෙහි දී මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂිකා ලලිතා බටුවිටගේ මහත්මිය දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපාන සමාජමය ගැටළු පිළිබඳ දේශනයක් පවත්වන ලදී. එදින ශිෂ්‍යත්වයේ පළමු වාරිකය ද ලබාදෙන ලදී.

මෙම ශිෂ්‍යත්වයේ මීළඟ වාරික ගෙවීම ජුනි මස 23 වන දින පැවති අතර එදින දරුවන් හා දෙමව්පියන් දැනුවත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති කළ්‍යාණි ගුණතිලක මහත්මිය විසින් සිදු කරමින් දරුවන්ගේ මානසික ගැටළු හඳුනා ගැනීම හා ජීවිත තක්ෂලාවෙන් හා ආයතනික පසුබිමෙන් ලබන අත්දැකීම් උපයෝගී කර ගනිමින් වැඩෙන මනස උදෙසා වන බලපෑම් පිළිබඳ දේශනයක් පවත්වන ලදී.

2018/2019 අවසාන වාරික ගෙවීම සැප්තැම්බර් 29 දින සිදු කළ අතර එදින දේශණය ආචාර්ය කේ.ආරියසිංහ මහතා සිදු කරමින් සිසුන් දැනුවත් කරන ලදී.

### 21.2. අතුරු කාරක සභාව සඳහා අරමුදල් ප්‍රවර්ධන වැඩසටහන

මේ යටතේ 2018 වර්ෂයේ ආරම්භ කරන ලද ලොතරැයිය 2019 වසරේ නිමා කරමින් ජුලි මස 28 වන දින ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනමන ලදී. මින් ලද ආදායම අධ්‍යාපන හා සංස්කෘතික අතුරු කාරක සභා අරමුදලට බැර කරන ලදී.

### 21.2. සිසු සවිය

මහරගම තරුණ බෞද්ධ සංගමය හා ඒකාබද්ධව කරුණා භාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන සිසු සවිය වැඩසටහන 2019 වසරේදී ද සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම වැඩසටහන පෙ.ව.8.00 සිට 12.00 දක්වා විවිධ වැඩසටහන් ඔස්සේ ක්‍රියාත්මකවේ. මෙහි සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරන බී.ජී.කරුණානන්ද මහතාට අපගේ ස්තූතිය හිමිවේ.

මෙහි දැනුම මෙන්ම විෂය බාහිර කටයුතු ද ක්‍රියාත්මක කෙරේ. ඊට අදාල තොරතුරු ඇතුලත් වැඩසටහන් විෂයයන් වලට අදාල තොරතුරු ද මෙහි දී සිසුනට ලබාදේ. මෙම දරුවන්ට ඔවුන්ටම ගැලපෙන පුස්තකාලයක් ආරම්භ කිරීම ද සතුටට කරුණකි.

## 21.3. අධ්‍යාපන සවිය

මෙම වැඩසටහන සඳහා මෙවර මහියංගන ප්‍රදේශය තෝරාගත් අතර එය වසරේ හොඳම වැඩසටහන බවට පත් කර ගැනීමට අවස්ථාව සැලසින. අ.පො.ස.(සා.පෙළ) විභාගය ඉලක්ක කර සංවිධානය විය. මෙය විද්‍යාව හා ගණිතය යන ප්‍රධාන විෂයයන් දෙකට සීමා විය.

1. **විද්‍යා විෂය**:- මහරගම තරුණ බෞද්ධ සංගමයේ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අතුරු කාරක සභාවේ සභාපති ආචාර්ය කේ.ආරියසිංහ මහතා විසින් සිදු කරන ලදී. මෙතුමා විශ්ව කීර්තියට පත් සම්භාවනීය විද්‍යා ග්‍රන්ථ කතුවරයෙකි.
2. **ගණිතය:-** මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.රත්නායක මහතා විසින් මෙහෙය වන ලදී. මෙතුමා ගණිත විෂයට අදාල ග්‍රන්ථ රාශියක කතුවරයෙකු ද වේ.
3. **ස්ථානය:-** මහියංගන ජාතික පාසලේ ශ්‍රවණාගාරයේදී පැවති මෙම සම්මන්ත්‍රණයට සිසුන් 600 පමණ සහභාගී විය.
4. **දිනය:-** 2019 ඔක්තොබර් 22 හා 23 දෙදින

**විශේෂ ස්තුතිය:-** මෙතෙක් පැවති ඉතා සාර්ථක වැඩසටහනක් බව නිහතමානිව සටහන් කරන අතර එය අප සංගමයට ඉමහත් කීර්තියක් අත්කර දුන් වැඩසටහනක් බව ද සටහන් කරන්නෙමු. මෙම බැරෑරුම් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට විවිධ අයුරින් සහාය දුන් ආචාර්ය ලීලාරත්න කංකානම්ගේ මහතාටත් ආරම්භයේ සිටම ව්‍යාපෘතිය සැලසුම් කරමින් අදාල පිරිස් සම්බන්ධීකරණය කර ගනිමින් අමිල මෙහෙවරක් ඉටු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ විශ්‍රාමික අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන) එම්.නන්දලාල් පෙරේරා මහතාටත් කරුණා භාරයේ සභාපති මහින්ද කරුණාරත්න මහතාටත් විද්‍යා විෂය නිබන්ධන මුද්‍රණය කර දුන් මහියංගනය ෂර්මිලා පොත්හල අධිපති මහේෂ් නිලන්ත මහතාටත් ඕපන් ආර්ක් ආයතනයේ සභාපති දයා හෙට්ටිආරච්චි මහතාටත් සෙනෙහසින් ස්තුතිය කරන්නෙමු.

# නිමාව හා පැතුම

අප තවත් වසරක නිමාවට පිවිසියෙමු. ඉකුත් වසර තුල ව්‍යාපෘති 34 ක් සාර්ථකව නිමා කළෙමු. මේ සියල්ලෙහි මතක සටහන් දෝතින් තුරුළු කර ගනිමින් අප නව වසරකට පිවිසියේ යයි සතුටු වන්නට ද හැකියාව තිබේ. ගෙවී ගිය වසරේ අත්දැකීම් මත නව වසර සැලසුම් කරමින් සිටින්නෙමු. එහෙත් අපට තක්සේරුවක් කළ හැකි වනුයේ ගෙවී ගිය කාලය ගැන මිස අනාගතය ගැන නොවේ. ඒ අනාගතය අවිනිශ්චිත බැවිනි. ඒනිසාම හෙට දවස අද දවස මත රැඳී සිටින බව වටහා ගනිමු. නැතහොත් අතීතය මත අනාගතය රැඳී සිටින බව නිසැකය.

"ගැමුණු කුමරු කොත්මලයට ගියේ ගම්නායකයාගේ ගව රැල බලන්නට නොවේ. එහෙත් ඔහු ගව රැල බැලුවේය. එසේම ඔහුට කොත්මලා කඳු වැටියෙන් දිය පහරක් ගමට හරවන්නට අදහසක් නොවීය. එහෙත් ඔහු කඳු වැටියේ දිය පහරක් ගමට හැරවීය. එසේම ගමේ කම්මල්කරු හමුවට ගියේ ඔහුට තම හැකියාව පෙන්වීමට ද නොවේ. එහෙත් ඔහු කම්මල්කරුට එය ද පෙන්වීය. අවසානයේ ඔහු කොත්මලය ගම තුලින් ඉසුරු බර ගම්මානයක් පිහිටුවා එහි මිහිර අත් වින්දේය."

මෙම තොරතුරු පද්ධතිය ඔබට පවසන දේ තේරුම් ගැනීමට අපි ඔබට ආරාධනය කරන්නෙමු. ඒ ඔබට සිතන්නට යමක් එහි පවතින බැවිනි. එය ඔබ තේරුම් ගතහොත් ඔබෙන් සංගමයට සිදුවන යහපත අති මහත් යයි අප විශ්වාස කරන්නෙමු. සිතා බැලීමටත්, ක්‍රියාත්මකවීමටත් මේ තුලින් ඔබට ආරාධනය කරන්නෙමු.

අපට අපේ සංගමයේ අනාගතය සඳහා එබඳු අත්දැකීම් බහුල බුද්ධිමත් පිරිසකගේ සහයෝගය සෑම වසරක් පාසාම අවශ්‍යව තිබේ. ඉකුත් වසරේ සංගමය වෙනුවෙන් විශිෂ්ඨ මෙහෙවරක් ඉටු කළ සංගමයේ කීර්තිනාමය වෙනුවෙන් කටයුතු කළ ඔබට, හෙට දවසේ අප වෙනුවෙන් අනාගතය භාර ගැනීමට සුදුසු සාමාජික පිරිසක් බිහි කිරීමට ශක්තියත් ධෛර්යයත් අත්වේවායි අප ප්‍රාර්ථනා කරන්නෙමු.

ඔබට තෙරුවන් සරණයි.

මෙයට
මෙත් සිතින්

ඊ.අයි.වී.පී.සමරසේකර
ගරු ප්‍රධාන ලේකම්